## ශීර්ෂය 07 - අධිකරණ සේවා කොමිෂන් සභාව

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------------

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

------------------------------------

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

-----------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 ඡේදය | - | සිගාස් ඩෙස්ක්ටොප් යෙදුම මඟින් 2021 දෙසැම්බර් 31 දිනට උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු වුවත් ඉදිරිපත් කර තිබුණේ 2021 දෙසැම්බර් මාසයට අදාල ශේෂ පිරික්සුමය. | අතපසු වීමකින් 2021 දෙසැම්බර් මස ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශනවල අමුණා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සඳහා 2022 ජුනි 09 | සමස්ථ අධිකරණ පද්ධතියටම අදාල සහ අධිකරණයන්හි ස්වාධීනත්වය කෙරෙහි සෘජුවම බලපාන කරුණු අඩංගු වන බැවින් ගරු නීතිපතිතුමාගේ අංක AG/28/2016 හා **2016.09.27** දිනැති ලිපිය ප්‍රකාරව අපගේ කාර්යසාධන වාර්තා විගණන වාර්තා සමඟ ඉදිරිපත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

දිනැතිව ලබා දී තිබූ පිලිතුරු ලිපියේ සඳහන් කර තිබුණේ ගරු නීතිපතිතුමාගේ අංක AG/28/2016 හා 2016.09.27 දිනැති ලිපිය ප්‍රකාරව සමස්ථ අධිකරණ පද්ධතියටම සහ අධිකරණයන් හි ස්වාධීනත්වය කෙරෙහි බලපාන කරුණු එහි අඩංගු වන බැවින් එකී වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල නොහැකි බවය.

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවට අයත් මෝටර් රථයක් අවුරුදු 04 ක පමණ කාලයක සිට නිශ්ක්‍රියව පැවතුණි. | මෙම මෝටර් රථය අවස්ථා තුනක දී අපහරණයට කටයුතු කලද, ගැනුම්කරුවෙකු ඉදිරිපත් නොවීම නිසා අපහරණය කළ නොහැකි විය.<br>2021.04.23 ලබාගත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවෙන් ද මෝටර් රථය අපහරණය කිරීම සුදුසු බව දන්වා ඇත. ඒ අනුව 2022.03.07 දින රැස් වූ ටෙන්ඩර් මණ්ඩලය විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ අපහරණයට තීරණය කර ඇත. මේ වන විට එම තක්සේරු මණ්ඩලය පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් 2021 අගෝස්තු 31 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 04 ට වැඩි කාලයක සිට එක් නිලධාරියකුගෙන් අයවිය යුතු රු.185,000 ක ණය ශේෂයක් පැවතුණි. | අදාල ණය ශේෂය හිමි නිලධාරියා 2017.07.12 දින සිට සේවය අත හැර ගියා සේ සලකා ඇත. එම ණය ශේෂය අයකර ගැනීමට රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 අනුව කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂය නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

**4.** **යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 ජුලි 18 දිනැති අංක DMS/1021/VOL 1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණ ද විගණිත දිනය වූ 2022 අප්‍රේල් 06 දින වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නැත. එසේ වුවද මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ අනුව කටයුතු කරමින් ආයතනය තුළ මූල්‍ය විනය නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **40** වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)<u>**කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ අතිරික්ත**</u> | | |
| (i) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 48 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 41 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | 2021 12.31.දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ විවිධ තනතුරු වල පුරප්පාඩු සංඛ්‍යාව 48 ක් බවත් එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 41 ක ප්‍රතිශතයක් බවත් දක්වා ඇත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ii) කොමිෂන් සභාවේ කාර්යන් ඉටුකර ගැනීම කෙරෙහි ඍජුවම බලපෑම් ඇති කරනු ලබන තනතුරු 07 ක පුරප්පාඩු 10 ක් පැවතුණි. | දැනට සිටින කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩුව පවතින තනතුරුවලට අයත් රාජකාරී ආවරණය කර ගැනීමට කටයුතු කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (iii)කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්ම වූ තථ්‍ය සේවක සංඛ්‍යාව 29 ක් විය. | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සිටින නිලධාරීන් 29 දෙනාගෙන්, පුරප්පාඩුව පවතින තනතුරුවලට අයත් රාජකාරී ආවරණය කර ගැනීමට කටයුතු කර ඇත. | අවශ්‍යතාවය පරිදි අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| (iv) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 05 දෙනකු බඳවා ගෙන තිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මඟින් සියලුම අධිකරණයන්හි අධිකරණ පරිපාලන කටයුතු සිදු කරන බැවින් ඒ පිළිබඳ දැනුම සහ පළපුරුද්ද අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සතුව පවතී. ඒ අනුව, එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. | අවශ්‍යතාව පරිදි මෙම කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (v) අධිකරණ පරිපාලන වැය විෂයය මඟින් වැටුප් ගෙවනු ලැබුව ද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන (පත්වීම්, උසස්වීම්, මාරුකිරීම් ආදිය) අධිකරණවල රාජකාරි සිදු කරනු ලබන විනිසුරුවරුන් සහ අධිකරණ කාර්ය මණ්ඩලය ඉහත විස්තරයට ඇතුලත් කර නොතිබුණි. එකී කාර්ය මණ්ඩලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් හෝ අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාගත නොහැකි විය. | අධිකරණවල පරිපාලනය කොමිෂන් සභාව විසින් සිදු කලද විනිසුරුවරුන් සහ අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශ වැය ශීර්ෂය (228) මඟින් වන නිසා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාවට අධිකරණවල රාජකාරී කරනු ලබන විනිසුරුවරුන් සහ අධිකරණ කාර්ය මණ්ඩලය ඇතුළත් නොවේ. | අධිකරණවල පරිපාලනය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන බැවින් විනිසුරුවරුන් සහ අධිකරණ කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු තබාගතයුතු වේ. |

**(ආ) මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදු කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |